අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
☎ +94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව
எனது இல.
My Ref.
ED/1/21/7/02

ඔබේ යොමුව
உமது இல.
Your Ref.

දිනය
திகதி
Date
2018.07 6

මත්ද්‍රව්‍ය නිවාරණ ඒකකය
20108
20 JUL 2018
ජනාධිපති කාර්යාලය

චක්‍රලේඛ අංක :- 30/2018

සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම විදුහල්පතිවරුන් වෙත,

"මතට එරෙහිව පාසලෙන් ජවයක්" පාසල් මත්ද්‍රව්‍ය නිවාරණ ජාතික වැඩසටහන

"මතට එරෙහිව පාසලෙන් ජවයක්" පාසල් මත්ද්‍රව්‍ය නිවාරණ ජාතික වැඩසටහන යටතේ අධ්‍යාපන අමාත්‍යාංශය හා මත්ද්‍රව්‍ය නිවාරණ ජනාධිපති කාර්ය සාධක බලකාය එක්ව මත්ද්‍රව්‍ය නිවාරණ කටයුතු පාසල් මට්ටමින් බලගැන්වීමේ වැඩසටහනක් ආරම්භ කර ඇත.

ඒ අනුව පාසල් මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී පහත ආකාරයට කටයුතු කිරීමට උපදෙස් දෙනු ලැබේ.

1.0 අධ්‍යාපන ලේකම්ගේ 2015/05/21 හා ED/01/02/09/03/02 අංක දරන උපදෙස් ලිපියට අනුව මේවන විටත් සෑම පාසලකම මත්ද්‍රව්‍ය නිවාරණ කමිටු පිහිටුවා තිබිය යුතුය. යම් හේතුවක් මත මේ දක්වා මත්ද්‍රව්‍ය නිවාරණ කමිටු පිහිටුවා නොමැති නම් වහාම අදාළ කමිටුව පිහිටුවිය යුතු අතර අක්‍රිය කමිටු ප්‍රතිසංවිධානය කළ යුතුය.

2.0 අධ්‍යාපන අමාත්‍යාංශය හා ජනාධිපති මත්ද්‍රව්‍ය නිවාරණ මෙහෙයුම් ඒකකය විසින් මත්ද්‍රව්‍ය නිවාරණය සම්බන්ධ පාසල් වැඩසටහන් සංවිධානය කරගැනීම, එම වැඩසටහන් ඇගයීම හා නියාමනය පිළිබඳ උපදෙස් සංග්‍රහයක් සකස්කර ඇති අතර තම පාසලේ මත්ද්‍රව්‍ය නිවාරණ ජාතික වැඩසටහන මෙම උපදෙස් සංග්‍රහයට අනුකූලව ක්‍රියාත්මක කිරීම විදුහල්පතිගේ වගකීම වේ.

2.1 මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන පාසල් මට්ටමින් ඇගයීම සඳහා අභ්‍යන්තර ඇගයීම් කමිටුවක් පිහිටුවා ගතයුතු අතර එම ඇගයීම් කමිටුව විදුහල්පති හෝ නියෝජ්‍ය විදුහල්පතිවරයෙකුගේ ප්‍රධානත්වයෙන් පිහිටුවිය යුතුය. එහි අනෙකුත් සාමාජිකයින් පහත ආකාරයට පත්කර ගත යුතුය.

- ගුරුභවතුන් දෙදෙනෙක්
- පාසල් මත්ද්‍රව්‍ය නිවාරණ කමිටුවේ සභාපති හා ලේකම්
- පාසල් මත්ද්‍රව්‍ය නිවාරණ කමිටුවේ වෙනත් සාමාජිකයින් පස්දෙනෙක්
- ආදි ශිෂ්‍ය සංගමයේ සාමාජිකයින් පස්දෙනෙක්
- පාසල් සංවර්ධන සමිතියේ සාමාජිකයින් පස්දෙනෙක්
- පාසල අයත් ප්‍රදේශයේ ප්‍රජා පොලිස් නිලධාරියෙක්
- මහජන සෞඛ්‍ය පරීක්ෂක
- පාසල අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය නියෝජනය කරමින් නිලධාරියෙක්